**2022 මැයි මාසයට අදාලව 2022.05.24 දින පවත්වන ලද**
**බිබිල ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව.**

**දිනය** - 2022.05.24
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.
**සහභාගිත්වය** -

| | |
|---|---|
| 01.එස්.ඒ.එම්. චන්ද්‍රසේකර බණ්ඩා මැතිතුමා | - ගරු උප සභාපති |
| 02. ඒ.එම්. සුදුනිලමේ මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 03. එම්.ඒ. උබේසේන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 04. බී. විල්මට් සිල්වා මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 05. කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 07. ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 08. බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 09. කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 10. එල්.ඒ.බී. චන්ද්‍රිකා මල්කාන්ති මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 11. ඩී.එම්. කරුණාවති මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 12. ජේ.ඒ. අමාලි කාංචනා ජයලත් මැතිතුමිය | - ගරු මන්ත්‍රිණී |
| 13. ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 14.ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 15. එච්.එම්. සරත් කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |
| 16. එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා | - ගරු මන්ත්‍රී |

**පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.**

ගරු සභාපතිතුමා අසනීප තත්වයෙන් සිටීම හේතුවෙන් උප සභාපතිතුමාට මූලාසනය හොබවන ලෙස දන්වමින් මූලාසනය භාර දී සභාවෙන් පිට වී යන ලදී.

2022.04.21 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා වෙත 2022.05.18 වන දින මා විසින් යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් ගරු උප සභාපතිතුමා සභාවට දන්වන ලදි.

එහිදි ගරු මන්ත්‍රි බී. විල්මට් සිල්වා මැතිතුමා පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රිනී ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් 2022.04.21 දිනැති සභා වාර්තාව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමා විසින් කරනු ලැබූ විශේෂ නිවේදන.

## 2.1. 2023 අයවැය සකස් කිරීම සඳහා ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවට හා සංවර්ධන සැලැස්ම සම්බන්ධවයි.

2020 ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව 2023 වර්ෂයේ අයවැය සකස් කිරීම සඳහා ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවට හා සංවර්ධන සැලැස්මට ඇතුලත් කිරිමට අදහස් කරනු ලබන බිබිල ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ යෝජනා ජූනි මස 30 වන දිනට පෙර ලබා දෙන ලෙස නිවේදනය කළේය.

## 03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 04.යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## 05.යථාපරිදි කල්දී ඇති යෝජනා.

## 05.01.ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමාගේ යෝජනා.

## 05.01.01.බිබිල සතිපොළ F5 කඩකාමරයේ අයිතිය මාරු කිරීම සම්බන්ධවයි.

බිබිල සතිපොළ F5 කඩ කාමරය බදුගෙන සිටි බිබිල,ඉලුකාපතන, ශ්‍රී මාලි ලිපිනයේ පදිංචි ඩබ්.එම්.මාලනී දයාවතී යන අයට F5 කඩකාමරය පවත්වාගෙන යාම අපහසු වීම හේතුවෙන් බිබිල,උඩබුබුල,කැබිල්ලකැටිය වත්ත ලිපිනයේ පදිංචි ඩී.එම්.හීං බණ්ඩා මහතා වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ඩී.එම්.හීං බණ්ඩා මහතා විසින් එම කඩ කාමරය පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපියකින් දන්වා ඇති අතර අදාල පැවරුම් ගාස්තු අය කර පවරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.02.අංක 13/B කඩකාමරයේ අයිතිය මාරු කිරීම සම්බන්ධවයි.

අංක 13/B කඩ කාමරය බදුගෙන සිටි කොටගම,අලුත්ගෙදර ලිපිනයේ පදිංචි ඒ.එම්.වීරසිංහ යන අයට අංක 13/B කඩකාමරය පවත්වාගෙන යාම අපහසු වීම හේතුවෙන් බිබිල,1 කණුව,මොණරාගල පාර, අංක 153/B ලිපිනයේ පදිංචි ඩී.එම්.හීං බණ්ඩා මහතා වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර බී.එම්.චන්දන ජයවර්ධන මහතා විසින් එම කඩ කාමරය පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලිපියකින් දන්වා ඇති අතර අදාල පැවරුම් ගාස්තු අය කර පවරා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී අදාල පැවරුම් ගාස්තුවට යටත්ව අය කිරිම සුදුසු බවත් මෙම යෝජනාවෙහි මුද්‍රණ දෝෂයක් හේතුවෙන් සටහන් වී ඇති ඩී.එම්.හීං බණ්ඩා මහතා යන නම වෙනුවට අදාල ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව බී.එම්.චන්දන ජයවර්ධන මහතා යන නම යොදා මෙය සංශෝධනය විය යුතු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාල පැවරුම් ගාස්තුවට යටත්ව අය කිරීම සුදුසු බවත් මෙම යෝජනාවෙහි මුද්‍රණ දෝෂයක් හේතුවෙන් සටහන් වී ඇති ඩී.එම්.හීං බණ්ඩා මහතා යන නම වෙනුවට අදාල ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව බී.එම්.චන්දන ජයවර්ධන මහතා යන නම යොදා මෙය සංශෝධනය විය යුතු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රි මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>05.01.03.එළගවමස් කඩකාමරයේ කඩකුලිය සම්බන්ධවයි.</u>

බිබිල,කනුල්වෙල ලිපිනයේ පදිංචි ජෙනුල් ආබිදින් රියාද් යන අය විසින් බිබිල ප්‍රාදේශීය සභාවට අයත් එළගවමස් වෙළඳසැල 2022.04.03 වන දින රටේ පවතින තත්ත්වය නිසා ඇඳිරිනීතිය පනවා තිබූ බැවින් එම දිනයට අදාල කඩ කුලිය අඩු කර දෙන මෙන් ඉල්ලීමක් කර ඇත.අදාල ඉල්ලීම සාධාරණ බැවින් අදාල කඩකුලිය අඩු කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රි බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී එක් දිනයකට පමණක් කඩ කුලිය අඩු කිරිමට නොහැකි බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
එක් දිනයකට පමණක් කඩ කුලිය අඩු කිරිමට නොහැකි බවට තීරණය කරන ලදී.
ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රි මණ්ඩලයේ එකඟතාවය හිමිනොවීමෙන් යෝජනාව ඒකමතිකව ප්‍රතික්ෂේප විය.

## <u>05.01.04. හිඟ වරිපනම් බදු මුදල් අය කිරීම සම්බන්ධ යෝජනාව සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු සීමාව තුල 2021.12.31 දිනට හිඟව පැවති රු.5,539,016.63 මුදලින් 2022.05.01 දින වන විට රු.347281.66 ක මුදලක් අය කර ගෙන ඇති අතර තව දුරටත් හිඟ රු.5191734.97 ක මුදලක් අය කර ගැනීමට ඇත.බදු කරුවන් කොපමන දැනුවත් කලත් බදු ගෙවීම පැහැර හැර ඇත.

දැනට හිඟව පවතින වරිපනම් බදු මුදලට අයත් දේපල වර්ෂ කිහිපයක්ම පාළුවට ගොස් ඇති ගොඩනැගිලි හා ඉඩම් අයිතිකරුවන් හඳුනා ගැනීමට නොහැකිව හිඟ මුදල් ලෙස ලේඛන ගතව ඇත. එබැවින් ආදායම් පරීක්ෂක මහතුන් විසින් නැවත එම දේපල සමීක්ෂණය කර හඳුනා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී මාස 03ක කාලයක් ඇතුලත සමීක්ෂණය කර වාර්තාවක් ලබා දීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මාස 03ක කාලයක් ඇතුලත සමීක්ෂණය කර වාර්තාවක් ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.05.බිබිල බදුල්ල මාර්ගයේ යල්කුඹුර වරිපනම් බදු ප්‍රතිශතය අඩු කිරීමේ යෝජනාව

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු පැනවීම සඳහා දියුණුගම් ප්‍රදේශයක් ලෙස 1990.11.30 දින 639 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ iv(අ) දරණ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇත.මෙම ගැසට් පත්‍රයේ බිබිල නගරයේ සිට බදුල්ල මාර්ගයේ ප්‍රධාන ජල ගබඩා ටැංකිය දක්වා හා කොටගම මාර්ගයේ කඩයිම් කදුර දක්වා මාර්ගය දෙපසට යාර 400 ක ප්‍රදේශය තුල පිහිටි දේපල වලින් වරිපනම් බදු අය කිරීම සඳහා නිවේදනය කර ඇත.

මේ සම්බන්ධව ආරම්භයේ සිටම විරෝධතාවය පලකර සිටින යල්කුඹුර ප්‍රදේශවාසීන් වරින් වර පෙත්සම්, ලිපි ඉදිරිපත් කරමින් කියා සිටිනුයේ නගරයේ සිට 6Km දුරින් පිහිටා ඇති මෙම ප්‍රදේශය නොදියුණු තත්වයේ පවතින හෙයින් වරිපනම් බදු අය නොකරන ලෙසයි.

ඒ අනුව 2022.03.05 දිනැති ලිපියෙන් යල්කුඹුර ගම්වාසීන් කියා සිටින්නේ යල්කුඹුර ප්‍රදේශයේ නැවත සමීක්ෂණයක් සිදු කොට සාධාරන බද්දක් අය කරන ලෙසයි.

එබැවින් ප්‍රදේශ වාසීන්ගේ ඉල්ලීම සලකා බලා බිබිල බදුල්ල මාර්ගයේ හුණුගල් කදුර යන සීමාවෙන් ඔබ්බට පිහිටි දේපල වල බදු ප්‍රතිශතය අඩු කර අය කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.06.කොවිඩ් 19 වෛරසය පැවති කාලය තුළ සභා දේපල සඳහා අය කල කුලී මුදල් අඩු කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව මඟින් වාර්ෂිකව ප්‍රසම්පාදන මඟින් බදු දෙනු ලබන බිබිල සතිපොල 2021.05.21 දින සිට 2021.06.21 දින දක්වා ඇඳිරිනීතිය පැවති බැවින් හා ජනතාව ඒකරාශී වන

ස්ථාන සීමා කර තිබූ බැවින් සතිපොල පැවැත්වීමට නොහැකි විය. එම නිසා 2021 මැයි හා ජූනි මස සතිපොල සඳහා අය කරනු කුලී මුදල් කපා හැරීම සුදුසු බවත්,

බිබිල එළගව මස් වෙළඳසැල මැයි මස විවෘත කරන ලද්දේ දින 13 ක් පමනක් බවත් කොරෝනා උවදුර හේතුවෙන් ඉන්පසු එම වෙළඳසැල බදු ගෙන සිටි දයානි ලංකා රත්නායක යන අයගේ සැමියා ජුනි මස 22 දින සිට කොවිඩ් වෛරසය වැළඳීම හේතුවෙන් රෝහල්ගතව සිට නිවසේ නිරෝධායනය වීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ උපදෙස් මත ජුලි මස 15 දින දක්වා කඩය වසා තබා ඇත. එබැවින් 2021 මැයි මස 13 සිට ජුලි මස 15 දින දක්වා බිබිල එළ ගව මස් වෙළඳසැල සඳහා කුලී මුදල් කපා හැරීම සුදුසු බවත්,

එසේම මෙම වෙළඳ සැල නැවත ඇදිරිනීතිය පැනවීම මත 2021 අගෝස්තු 18 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා වසා තිබුණු බවත් එබැවින් එදින සිට කුලී මුදල් කපා හැරීම සුදුසු බවත්, එසේම කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය හේතුවෙන් කණුල්වෙන ප්‍රදේශය වසා තිබූ බැවින් කණුල්වෙල එළ ගව මස් වෙළඳසැල වසා තිබුණු බැවින් 2021 ජුලි මස 01 දින සිට 15 දින දක්වා මෙම වෙළඳසැලෙහි කුලී මුදල් කපා හැරීම සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී 2021 මැයි හා ජුනි මස බිබිල සතිපොල සඳහා අය කරන කුලී මුදල් කපා හැරීම සුදුසු බවත්, 2021 මැයි මස 13 සිට ජුලි මස 15 දින දක්වා සහ 2021 අගෝස්තු 18 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා බිබිල එළ ගව මස් වෙළඳසැල සඳහා කුලී මුදල් කපා හැරීම සුදුසු බවත්, කණුල්වෙල ප්‍රදේශය හුදකලා කර තිබූ බැවින් 2021 ජුලි මස 01 දින සිට 15 දින දක්වා කණුල්වෙල එළ ගව මස් වෙළඳසැලෙහි කුලී මුදල් කපා හැරීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජී. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

2021 මැයි හා ජුනි මස බිබිල සතිපොල සඳහා අය කරන කුලී මුදල් කපා හැරීම සුදුසු බවත්, 2021 මැයි මස 13 සිට ජුලි මස 15 දින දක්වා සහ 2021 අගෝස්තු 18 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා බිබිල එළ ගව මස් වෙළඳසැල සඳහා කුලී මුදල් කපා හැරීම සුදුසු බවත්, කණුල්වෙල ප්‍රදේශය හුදකලා කර තිබූ බැවින් 2021 ජුලි මස 01 දින සිට 15 දින දක්වා කණුල්වෙල එළ ගව මස් වෙළඳසැලෙහි කුලී මුදල් කපා හැරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.07.පොදු වෙළඳපොල වැසිකිළිය අසල කඩ කාමරය ප්‍රසම්පාදනය කර බදු දීම.

පොදු වෙළඳපොල B 17 කඩ කාමරයට යාබද කඩ කාමරය ප්‍රසම්පාදනය කර බදු දීම සඳහා දෙවන වර ප්‍රසම්පාදන කැඳවන ලදී. 2022.03.01 දින සිට බදු දීම සඳහා අවම ලංසුව රු 250,000.00 ක් ලෙස ප්‍රසම්පාදන කැඳවන ලද නමුත් මෙම කඩ කාමරය බදු ගැනීම සඳහා කිසිවෙක් ඉදිරිපත් නොවීය. මේ පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී පොදු වෙළඳපොල B 17 කඩ කාමරයට යාබද කඩ කාමරය තෙවන වරට ප්‍රසම්පාදනය කර බදු දීම සඳහා අවම ලංසුව රු 150,000.00ක් සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

පොදු වෙළඳපොල B 17 කඩ කාමරයට යාබද කඩ කාමරය තෙවන වරට ප්‍රසම්පාදනය කර බදු දීම සඳහා අවම ලංසුව රු 150,000.00ක් සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.08.2022.01.10 සිට 2022.12.31 දක්වා පිටකුඹුර සති පොලෙහි බදු මුදල ගෙවීම සම්බන්ධවයි.

බිබිල,රදළියද්ද, 39 කණුව ලිපිනයෙහි පදිංචි එම්.පී.බී.එන්. ජයවීර යන අය විසින් 2022 අප්‍රේල් මස බදු කුලිය ගෙවිම සම්බන්ධයෙන් 50%ක සහන මුදලක් ලබා දෙන ලෙස ඉල්ලමින් ලිපියකින් දන්වා ඇති අතර ඒ සඳහා පහත හේතු බලපෑ ඇත.

01. අප්‍රේල් මස පළමු සතියේ සිටම පෙර අවුරුදු මෙන්ම සුපුරුදු පරිදි ජනතාව බිබිල නගරය වෙත ඇදී යාම හේතුවෙන් පිටකුඹුර සති පොල ආදායම අවම මට්ටමක පැවතීම.

02. දෙවන සතිය වන අප්‍රේල් මස 12 වන දින නව අවුරුදු උදාව හේතුවෙන් අඟහරුවාදා නියමිත සති පොල නොපැවැත්වීම.

03. අප්‍රේල් මස 12 වන දින සති පොල වෙනුවෙන් අතිරේක පොල දිනයක් ලෙස අප්‍රේල් 08 සිකුරාදා දින යොදා ගත් නමුත් පසුගිය වසරේ මෙන්ම වෙළෙන්දන්ගේ හා පාර්භෝගිකයින්ගේ හිඟතාවය නිසා ප්‍රචාරණ වියදම පියවා ගැනිමට නොහැකි විය.

04. අප්‍රේල් මස තුන් වන සතිය හා හතරවන සතිය නව අවුරුදු සැමරීම හේතුවෙන් වෙළෙන්දන්ගේ හා පාර්භෝගිකයින්ගේ සීමිත පැමිණීම නිසා ආදායම අවම විය.

මේ පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී ඉහත කරුණු සැලකිල්ලට ගෙන 2022 අප්‍රේල් මස බදු කුලිය ගෙවීම සම්බන්ධයෙන් 50%ක සහන මුදලක් ලබා දීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

2022 අප්‍රේල් මස බදු කුලිය ගෙවීම සම්බන්ධයෙන් 50%ක සහන මුදලක් ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.09.නිර්වන්දි ගිවිසුමකට යටත්ව තාප්ප ඉදි කිරිම සම්බන්ධවයි.

බිබිල, මහියංගන පාර ,ඉසුරු උයන හි පදිංචි ජේ.පී.ලීලාරත්න මයා තාප්පයක් ඉදි කිරිම සඳහා සංවර්ධන කාර්යයන් සඳහා අවසර ලබා ගැනීමේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇත.මෙම අයදුම්පත්‍රය 2022.04.05 දින ප්‍රාදේශීය සභාවේදී පවත්වනු ලැබූ සැලසුම් කමිටුවට ඉදිරිපත් කළ අතර එහිදී තීරණය කරන ලද්දේ මාර්ග රක්ෂිත හැර ගොඩනැගිලි සීමාව තුළ බිබිල ප්‍රාදේශීය සභාවේ නිර්වන්දි ගිවිසුමකට යටත්ව තාප්පය ඉදි කිරීම සුදුසු බවයි.එබැවින් ප්‍රාදේශීය සභාවේ නිර්වන්දි ගිවිසුමකට යටත්ව තාප්ප ඉදි කිරිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී කාර්මික නිලධාරිතුමිය විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර සම්පූර්ණ වාර්තාවක් සමඟ ඊ ළග සභා වාරයේදී මෙම යෝජනාව නැවත ඉදිරිපත් කිරීම සුදුසු බවත් ඉඩම් අනු කොටස් කිරීමේ අයදුම් පත්‍ර නිකුත් කිරීම,ගොඩනැගිලි අයදුම් පත්‍ර නිකුත් කිරිම හා වීථි රේඛා අයදුම් පත්‍ර නිකුත් කිරීමේ දී උපදෙස් පත්‍රිකාවක් ලබා දීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

කාර්මික නිලධාරිතුමිය විසින් ස්ථානීය පරීක්ෂාවක් සිදු කර සම්පූර්ණ වාර්තාවක් සමඟ ඊ ළග සභා වාරයේදී මෙම යෝජනාව නැවත ඉදිරිපත් කිරීම සුදුසු බවත් ඉඩම් අනු කොටස් කිරීමේ

අයදුම් පත්‍ර නිකුත් කිරීම,ගොඩනැගිලි අයදුම් පත්‍ර නිකුත් කිරීම හා වීථි රේඛා අයදුම් පත්‍ර නිකුත් කිරීමේ දී උපදෙස් පත්‍රිකාවක් ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.10.දියර පොහොර නිෂ්පාදනය කිරීම සම්බන්ධවයි.

මාළු අපද්‍රව්‍ය යොදාගනිමින් ගුණාත්මක හා ප්‍රමිතියෙන් යුතු දියර පොහොර නිෂ්පාදනය කර අලෙවි කිරීම තුලින් ප්‍රාදේශීය සභාවට ආදායම් මාර්ගයක් ලබා ගැනිමට හැකි අතර මාළු අපද්‍රව්‍ය දිනපතා මාළු වෙළඳසැලෙන් නොමිලේ ලබා ගත හැකි අතර ඒ සඳහා අවශ්‍ය දුඹුරු සීනි ඇතුළු අදාල සියළු ද්‍රව්‍ය මිලදී ගැනීමට අවශ්‍ය මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී මේ සම්බන්ධව ව්‍යාපෘති වාර්තාවක් අවශ්‍ය බවත් මෙය මහ පරිමාණයෙන් සිදු නොකර පළමු පියවර ලෙස පරීක්ෂණ මට්ටමෙන් ආරම්භ කිරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධව ව්‍යාපෘති වාර්තාවක් අවශ්‍ය බවත් මෙය මහපරිමාණයෙන් සිදු නොකර පළමු පියවර ලෙස පරීක්ෂණ මට්ටමෙන් ආරම්භ කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.11. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් Up RY – 5342 අංක දරණ ගලි බවුසරය ඩබල් වීල් කිරීම සම්බන්ධවයි.

ඉහත අංක දරණ ගලිබවුසරය අධික බර හේතුවෙන් නිතර රෝද වල රේසර් කැඩී යාම නිසා වැඩි දුරක් ධාවනය කිරීමට නොහැකි තත්වයකට පත්ව ඇත. ඒමනිසා එය අලුත්වැඩියා කිරීම සඳහා අදාල මිලගණන් කැඳවා මිල සාධාරණීකරන වාර්ථාවක් ලබා ගැනීම සඳහා යොමු කරන ලදී. එහිදී පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂක තුමාගේ උපදෙස් පරිදි රථය පරික්ෂා කර බලා නිර්දේෂයක් ලබා ගැනීම සඳහා ඌව පළාත් සභාව වෙත ලිපි යොමු කරන ලදී.

ඉහත ලිපි යොමු කිරීමෙන් පසු ලබා දුන් උපදෙස් පරිදි මෙම අලුත්වැඩියා කටයුත්ත සඳහා නිර්දේශ ලබා ගැනීමට මොණරාගල මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්තුමා වෙත ලිපි

යොමු කරන ලදී. එහිදී මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් තුමාගෙ උපදෙස් පරිදි මෙම අලුත් වැඩියා කටයුතු සිදුකිරීමට අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම සඳහා නාරාහේන්පිට පිහිටි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ගෙන යාමට සිදු වන බව දැනුම් දී ඇත.

බිබිල පොදු වෙළඳපොල අසල හා මාළු වෙළඳපොල අසල ඇති වැසිකිලි වලවල් නිතර උතුරා යාම හේතුවෙන් දිනපතා වැසිකිලි වලවල් වල අපද්‍රව්‍ය ඉවත් කිරිමට සිදු වේ.ගලි බවුසරය අළුත් වැඩියා නොකිරීම හේතුවෙන් මෙම කාර්යය කිරීමට නොහැකි වීම නිසා ජනතාවගේ දෝෂාරෝපණ එල්ල වීම මෙන්ම ප්‍රාදේශීය සභාවට ආදායම අහිමි වී ඇති අතර සභාව වෙත ගලි සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන ජනතාවගෙන් එම සේවාව දිගින් දිගටම දිර්ඝ කාලයක් ලබා නොදීම හේතුවෙන් ද අප ආයතනයට විවිධ ලෙස දෝෂාරෝපණ එල්ල වෙමින් පවතින බැවින් මෙය අලුත්වැඩියා කිරීම සුදුසු බවත් ඒ සඳහා ලීලාරත්න මෝටර්ස් සහ ඉන්ජිනියරින් ආයතනය විසින් මෙම අලුත්වැඩියා කිරීම සඳහා රු.205,850.00 ක මුදලක් ඇස්තමේන්තු කර ඇති අතර එම මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී අලුත්වැඩියාව සිදු කිරීම අත්‍යඅවශ්‍ය කටයුතුත්තක් නිසා මෙය සිදු කිරීම සුදුසු බවත් ඇස්තමේන්තු මුදල සභා අරමුදලින් දැරිම සුදුසු බවත් සාකච්ඡා විය.එහි දී ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා විසින් අදහසක් ලෙස ගලි බවුසරය ඩබල් වීල් නොකර රේසරය, හබ් එක හා ඇක්සලය විශාල කිරීමෙන් ධාරිතාව දරා ගැනීමට හැකි ලෙස සකස් කල හැකි බවත් ඒ පිළිබඳව තමාට අත්දැකීම් ඇති බවත් පැවසීය. ඒ අනුව කාර්මික නිලධාරිගෙන් වාර්තාවක් ලබා ගෙන මෙම ක්‍රම දෙකෙන් සුදුසු ක්‍රමය තෝරා ගෙන නැවත නැවත ආපදාවලට ලක් නොවී දීර්ඝ කාලීනව පවත්වාගෙන යාමට හැකි වන ආකාරයෙන් අලුත්වැඩියාව සිදු කිරීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අලුත්වැඩියාව සිදු කිරීම අත්‍යඅවශ්‍ය කටයුතුත්තක් නිසා මෙය සිදු කිරීම සුදුසු බවත් ඇස්තමේන්තු මුදල සභා අරමුදලින් දැරිම සුදුසු බවත් සාකච්ඡා විය.එහි දී ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා විසින් අදහසක් ලෙස ගලි බවුසරය ඩබල් වීල් නොකර රේසරය, හබ් එක හා ඇක්සලය විශාල කිරීමෙන් ධාරිතාව දරා ගැනීමට හැකි ලෙස සකස් කල හැකි බවත් ඒ පිළිබඳව තමාට අත්දැකීම් ඇති බවත් පැවසීය. ඒ අනුව කාර්මික නිලධාරිගෙන් වාර්තාවක් ලබා ගෙන මෙම ක්‍රම දෙකෙන් සුදුසු ක්‍රමය තොරා ගෙන නැවත නැවත ආපදාවලට ලක් නොවී දීර්ඝ කාලීනව පවත්වාගෙන යාමට හැකි වන ආකාරයෙන් අලුත්වැඩියාව සිදු කිරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.12. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් Up LL - 6930 අංක දරණ ටිපර් රථය අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි.

ඉහත අංක දරණ ටිපර් රථය බිබිල මහජන ක්‍රීඩාංගනයේ පස් ප්‍රවාහනය කරන අතර හදිසියේම අක්‍රිය වීම හේතුවෙන් එහි රැහැන් පද්ධතිය පරික්ෂා කිරීම සඳහා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් වෙත ඇදගෙන ගොස් දැමූ අතර, එය පරික්ෂා කිරීමේදී එහි එක් රැහැන් කොටසක් උණු වී ඇති බව එහි කාර්මික නිලධාරියා විසින් අප වෙත දැනුම් දීමෙන් අනතුරුව එම ස්ථානයට ගොස් නිරීක්ෂනය කිරීමේදී එය සනාථ විය.

තවද, දැනට මහජන ක්‍රීඩාංගණයේ අලුත්වැඩියා කටයුතු සිදු කරන අතර ඒ සඳහා පිටතින් වාහන කුලියට ලබා ගැනීම අධික වියදම් දැරීමට සිදුවන බැවින් හා රට තුල දැනට උද්ගතව ඇති තත්වය හේතුවෙන් පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය වෙත මෙම රථය ඉදිරිපත් කිරීම ගැටළු සහගත වේ. එබැවින් මෙය රු.25,000.00ක උපරිමයකට යටත්ව අලුත්වැඩියා කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකගතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.13. බිබිල බස්නැවතුම්පොළ අවට භූමියෙහි තාවකාලික ස්ථාන බදු දීමට අදාළ කුලී මුදල් සම්බන්ධවයි.

බිබිල බස් නැවතුම්පොළ අවට භූමියේ තාවකාලික කඩ පවත්වාගෙන යාම සඳහා තාවකාලික බදු පදනම මත කොටස් වෙන්කර දීම සඳහා 2021.10.21 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවේ අංක 05.01.06 සභා තීරණය අනුව පහත සඳහන් අයට මෙම ස්ථාන බදු දීමට ගිවිසුම් ගතව ඇත.

| නම | ලිපිනය | හැඳුනුම්පත් අංකය |
|---|---|---|
| ඒ.ඩී.ලලිත් නිහාල් මහතා | අකිඳු,දියකොබල,බිබිල | 680372241V |
| කේ.එම්.සුදර්ශ හර්ෂාන් මහතා | අංක 88/B,වැව පාර,රදලියද්ද,බිබිල | 200303512031 |
| එම්.එම්.වසන්ත ලක්මාල් මහතා | කවුඩැල්ල,බිබිල | 821724848V |
| කේ.ටී.චන්ද්‍රසේන මහතා | පල්ලේඅරාව,දොඩම්ගොල්ල,බිබිල | 721602397V |
| ආර්.එම්.සමන්ති මිය | රතුපස්කැටිය,කවුඩැල්ල්,බිබිල | 198352702419 |

මෙම අයගෙන් ජංගම වෙළදාම සඳහා 2022 ගැසට් නිවේදනය අනුව අය කළ රු.8,000.00 ක මුදල 2022 මැයි මස සිට මාසික කුලී මුදල් ලෙස අයකිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.14. රු.27,000,000.00 ස්ථාවර තැන්පත් මුදල නැවත ආයෝජනය කිරීම සම්බන්ධවයි.**

නායකඳුර ජල යෝජනා ව්‍යාපෘතියට අදාල රු.27,000,000.00 මුදල ස්ථාවර තැන්පතු ලෙස බිබිල මහජන බැංකුවේ ආයෝජනය කර තිබූ අතර එම තැන්පතු මුදල 2022.04.06 දිනට කල් පිරී ඇත.එම මුදල නැවත 7.25% ක පොළිය යටතේ නැවත ආයෝජනය කර ඇත. නමුත් මේ වන විට ස්ථාවර තැන්පත් පොළී ප්‍රතිශත වැඩි වී ඇති බැවින් මිල ගණන් කැඳවීම මගින් වැඩිම පොළි ප්‍රතිශතයක් (21%) ජාතික ඉතිරි කිරිමේ බැංකුවෙන් ලැබුනු අතර මෙම ස්ථාවර තැන්පත් මුදල අවලංගු කොට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ නැවත ආයෝජනය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.15. බිබිල පොදු වෙළඳපොල B කඩ කාමරවල වහලය ඉදි කිරිම සඳහා අනුමැතිය ලබා ගැනිම සම්බන්ධවයි.**

බිබිල පොදු වෙළඳපොල B කඩ කාමරවල වහලය වැසි කාලය නිසා කඩිනමින් ඉදි කිරිමට සිදු වූ බැවින් ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා පුහුණු ශ්‍රමය ලබා ගැනීම වෙනුවෙන් දැරූ වියදම සඳහා අනුමැතිය ලබා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## **05.01.16. ආයුර්වේද කම්කරු තනතුර සඳහා පවතින පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවේ නිදහස් ආයුර්වේද මධ්‍යස්ථානයේ කම්කරු තනතුරෙහි සේවය කළ බී.එම්. සමරකෝන් මහතා 2022.05.02 වන දින විශ්‍රාම ලබා ඇති බැවින් එම පුරප්පාඩුව සඳහා අයෙකු බඳවා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී දැනට බිබිල නිදහස් ආයුර්වේද මධ්‍යස්ථානයේ ස්වේච්ඡාවෙන් සේවය කරනු ලබන ආර්.එම්.අප්පසරා මාධවී රාජපක්ෂ මිය මෙම පුරප්පාඩුව සඳහා බඳවා ගැනීම සුදුසු බවත් මෙම තනතුර සඳහා අලුතෙන් බඳවා ගැනීමක් සිදු නොකරීම සුදුසු බවටත් සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

දැනට බිබිල නිදහස් ආයුර්වේද මධ්‍යස්ථානයේ ස්වේච්ඡාවෙන් සේවය කරනු ලබන ආර්.එම්.අප්පසරා මාධවී රාජපක්ෂ මිය මෙම පුරප්පාඩුව සඳහා බඳවා ගැනීම සුදුසු බවත් මෙම තනතුර සඳහා අලුතෙන් බඳවා ගැනීමක් සිදු නොකරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.17. සභා අරමුදලින් කරනු ලබන සියළුම ගෙවීම් සඳහා චෙක්පත් අත්සන් කිරීමේ බලය පැවරීම.

බිබිල ප්‍රාදේශිය සභාව මඟින් බිබිල මහජන බැංකුවේ පවත්වා ගෙන යනු ලබන 1-001-0-0000403 දරණ ජංගම ගිණුම සඳහා සභාව වෙනුවෙන් චෙක්පත් අත්සන් කරන ලද සභා ලේකම් ඒ.බී.ප්‍රසංග නලින් මහතා තනතුරෙන් ඉවත් වී ඇති බැවින් නව සභා ලේකම් ලෙස පත් වී ඇති ඩී.එම්.අනුෂා සුදර්ශනී දිසානායක මහත්මියට අප සභාව නමින් බිබිල මහජන බැංකුවේ පවත්වා ගෙන යනු ලබන 1-001-0-0000403 දරණ ගිණුමේ චෙක්පත් අත්සන් කිරීමේ බලය පැවරිම සුදුසු බව මෙම ගරු සභාව වෙත යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.18. නාගරික හා ළමා උද්‍යානයක් ඉදි කිරීම සඳහා ඉඩමක් ලබා ගැනිම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ළමා හා නාගරික උද්‍යානයක් ඉදිකිරීම සඳහා ඉඩමක් ලබා ගැනීමට සුදුසු බවත්, ඒ සඳහා බිබිල අම්පාර මාර්ගයේ වලච්චත්ත බුබුල අසල වෙල්යායට යාබඳව පිහිටි අක්කර 01 ක පමණ බිම් කැබැල්ල ඉතාමත් උචිත වන්නේ අවට පරිසරය ඉතාමත් අලංකාර පාරිසරික සාධක වලින් සමන්විත ස්ථානයක් වීමයි. එම ඉඩම ලක්ෂ 50 ක් පමණ වටිනාකමකින් යුක්ත වන අතර එම ඉඩම තක්සේරු කොට සභා අරමුදලින් ලබා ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එහිදී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමාගේ අදහසක් ලෙස මුළු බිබිල ප්‍රදේශය තුළ අසූචි ගඳ ඇති බවත් පොදු වෙළඳපල ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ වහලය කොටස සිවිලිම් ගසා නොමැති නිසා පරවියන් කැත කරන බවත් ගම්වල ජීවත්වන පවුල්වලින් 10% ක් වත් වැසිකිලි හා ජල පහසුකම් නොමැතිව ජීවත්වන බවත් එම ගැටළු ගැටළු ලෙස හඳුනා නොගනිමින් මෙවැනි ඉඩම් මිලදි ගැනීමට යොමු වීම හාස්‍ය ජනක ක්‍රියාවක් බවත් මෙලෙස මිලදී ගැනිමට යෝජනාකර ඇත්තේ කුඹුරු ඉඩමක් බවත් මෙය ගොඩ කිරීමට හැකියාවක් පවතීද යන්න ගැටළුවක් පවතින බවත් මෙවැනි මුදලක් මේ අවස්ථාවේ දී වැය කිරිම සුදුසුද යන්නත් පවසමින් මෙම යෝජනාවට විරුද්ධ වන බව ප්‍රකාශ කරන ලදී. එච්.එම්. සරත් කුමාර මැතිතුමාගේ අදහසක් ලෙස මෙවැනි අවශ්‍යතාවයක් පවතින බව කාගෙන්වත් ඉල්ලීමක් නොමැති බවත් දැනට ඇති ළමා උද්‍යානවලවත් වල් කපා පිරිසිදු නොකර අසෝබන ආකාරයෙන් පවත්වාගෙන යන බවත් මෙය මිලදී ගැනීමට විරුද්ධ වන බව ප්‍රකාශ කරන ලදී. එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහසක් ලෙස මෙම ඉඩම ලබා ගැනීම සුදුසු බවත් මුදල් පිළිබඳ ගැටළුවක් ඇති බවත් මේ සඳහා විකල්ප ඉඩමක් ඇත්නම් ඒ සඳහා අවධානය යොමු කිරිම සුදුසු බවත් මෙය අනාගත පරපුරට බොහෝ ප්‍රයෝජනවත් වන බවත් මහජන ක්‍රීඩාංගනය වෙනුවට අළුත් ක්‍රීඩාංගනයකටද යොමු වන්නේ නම් සුදුසු බවත් නගර අලංකරණය සඳහා තමන් කැමැත්තක් ඇති බැවින් සියළු මන්ත්‍රීවරුන් එක්ව මෙම ස්ථානය පරීක්ෂා කර ගණුදෙනුවල විනිවිධ භාවයකින් යුක්තව කටයුතු කිරීම සුදුසු බවටත් ප්‍රකාශ කරන ලදී. ඒ.එම්. සුදුනිලමේ මැතිතුමා විකල්ප අදහසක් ලෙස සභාවට අයිතිය ඇති කට්ටි කල ඉඩම්වලින් කොටසක් තෝරාගෙන භාවිතයට ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. බී. විල්මට් සිල්වා මැතිතුමා අදහස් දක්වමින් මීට වසර කිහිපයකට පෙර මඩකලපු පාරේ මිලදී ගැනීමට ගිය ඉඩමක් ලබා ගැනීමට නොහැකි වූයේ මන්ත්‍රීවරුන්ගේ මෙවැනි මතභේදකම් නිසා බවත් මෙම ඉඩම බලා විනිවිදබාවයකින් යුතුව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර ප්‍රාදේශීය සභාවේ වත්කමක් ලෙස පවරාගෙන ඉදිරි කටයුතු සඳහා යොදා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. ඉන් පසු මෙම යෝජනාව ඊ ළඟ සභා වරයේ දී නැවත ඉදිරිපත් කිරීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමාගේ අදහසක් ලෙස මුළු බිබිල ප්‍රදේශය තුළ අසූචි ගඳ ඇති බවත් පොදු වෙළඳපල ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ වහලය කොටස සිවිලිම් ගසා නොමැති නිසා පරවියන් කැත කරන බවත් ගම්වල ජීවත්වන පවුල්වලින් 10% ක් වත් වැසිකිලි හා ජල පහසුකම් නොමැතිව ජීවත්වන බවත් එම ගැටළු ගැටළු ලෙස හඳුනා නොගනිමින් මෙවැනි ඉඩම් මිලදි ගැනීමට යොමු වීම හාස්‍ය ජනක ක්‍රියාවක් බවත් මෙලෙස මිලදී ගැනිමට යෝජනාකර ඇත්තේ කුඹුරු ඉඩමක් බවත් මෙය ගොඩ කිරීමට හැකියාවක් පවතීද යන්න ගැටළුවක් පවතින බවත් මෙවැනි මුදලක් මේ අවස්ථාවේ දී වැය කිරිම සුදුසුද යන්නත් පවසමින් මෙම යෝජනාවට විරුද්ධ වන බව ප්‍රකාශ කරන ලදී. එච්.එම්. සරත් කුමාර මැතිතුමාගේ අදහසක් ලෙස මෙවැනි අවශ්‍යතාවයක් පවතින බව කාගෙන්වත් ඉල්ලීමක් නොමැති බවත් දැනට ඇති ළමා උද්‍යානවලවත් වල් කපා පිරිසිදු නොකර අසෝබන ආකාරයෙන් පවත්වාගෙන යන බවත් මෙය මිලදී ගැනීමට විරුද්ධ වන බව ප්‍රකාශ කරන ලදී. එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහසක් ලෙස මෙම ඉඩම ලබා ගැනීම සුදුසු බවත් මුදල් පිළිබඳ ගැටළුවක් ඇති බවත් මේ සඳහා විකල්ප ඉඩමක් ඇත්නම් ඒ සඳහා අවධානය යොමු කිරිම සුදුසු බවත් මෙය අනාගත

පරපුරට බොහෝ ප්‍රයෝජනවත් වන බවත් මහජන ක්‍රීඩාංගනය වෙනුවට අළුත් ක්‍රීඩාංගනයකටද යොමු වන්නේ නම් සුදුසු බවත් නගර අලංකරණය සඳහා තමන් කැමැත්තක් ඇති බැවින් සියළු මන්ත්‍රීවරුන් එක්ව මෙම ස්ථානය පරීක්ෂා කර ගණදෙනුවල විනිවිධ භාවයකින් යුක්තව කටයුතු කිරීම සුදුසු බවටත් ප්‍රකාශ කරන ලදී. ඒ.එම්. සුදුනිලමේ මැතිතුමා විකල්ප අදහසක් ලෙස සභාවට අයිතිය ඇති කට්ටි කල ඉඩම්වලින් කොටසක් තෝරාගෙන භාවිතයට ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. බී. විල්මට් සිල්වා මැතිතුමා අදහස් දක්වමින් මීට වසර කිහිපයකට පෙර මඩකලපු පාරේ මිලදී ගැනීමට ගිය ඉඩමක් ලබා ගැනීමට නොහැකි වූයේ මන්ත්‍රීවරුන්ගේ මෙවැනි මතභේදකම් නිසා බවත් මෙම ඉඩම බලා විනිවිදබාවයකින් යුතුව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර ප්‍රාදේශීය සභාවේ වත්කමක් ලෙස පවරාගෙන ඉදිරි කටයුතු සඳහා යොදා ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. ඉන් පසු මෙම යෝජනාව ඊ ළඟ සභා වරයේ දී නැවත ඉදිරිපත් කිරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.
ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රි මණ්ඩලය විසින් ඉදිරි සභා වාරයේ දී ඒ පිළිබඳ වැඩිදුර සාකච්ඡා කර තීරණයක් ගැනීමට එකඟතාවය පල කරන ලදී.

## 05.01.19. දොඩම්ගොල්ල කඩ කාමර වල නව තක්සේරු මුදල් අය කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාව සතු දොඩම්ගොල්ල ගොඩනැගිල්ලේ කඩ කාමර 2022 මාර්තු සිට ප්‍රසම්පාදන මඟින් බදු දී ඇත.ඔවුන් විසින් ඉදිරිපත් කල ප්‍රසම්පාදන වටිනාකම මත කඩ කාමර සඳහා නව කුලී මුදල් තක්සේරු කර ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යවන ලදි.ඒ අනුව ඔවුන්ගේ නව කුලී මුදල් සඳහා තක්සේරු වාර්තාව ලැබී ඇත.මෙම නව කුලී මුදල් අය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

තක්සේරු කළ කඩකාමරවල මාසික කුලිය පහත දැක්වේ.

| කඩ කාමර අංකය | නාමික මාසික කුලිය (රු) |
|---|---|
| 01 | 500 |
| 02 | 500 |
| 03 | 500 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.20.JCB යන්ත්‍රය සඳහා ඉදිරිපත් කර තිබූ මිල ගණන් සංශෝධනය කිරීම සම්බන්ධවයි.

DMG කොන්ත්‍රාත් ආයතනය මඟින් බිබිල ප්‍රාදේශීය සභාවට JCB යන්ත්‍රය ලබා දෙන විට ඉන්ධන සහ අනෙකුත් ද්‍රව්‍යවල මිල ඉතා පහළ මට්ටමක පැවති අතර දිනෙන් දින අධික ලෙස ඉන්ධන මිල ඉහල යාම නිසා වැඩ පැයක මිල රු. 5100.00 දක්වා වැඩි කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර එම ඉල්ලීම සාධාරණ බැවින් එම මුදල ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රි ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.21.ටැංගොඩ කීණගහ කඳුර මාර්ගයට පස් පිරවීම සම්බන්ධවයි.

ලේකම්,ඊතනවත්ත සුමිතුරෝ සංසදය, මෙගොඩ ඊතනවත්ත, දොඩම්ගොල්ල, බිබිල ලිපිනයෙහි පදිංචි ගම් වාසින් විසින් ටැංගොඩ කීණගහ කඳුර මාර්ගය බිබිල ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් වන අතර වරිපනම් කලාපයට අයත් වේ.දැනට මෙම වාරි මාර්ගය සෝදා පාළුවට ලක් වී ඇති බැවින් කිහිප ස්ථානයක වලවල් සෑදී ඇත. එම ස්ථාන සඳහා පස් පුරවා සාදා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර එම ඉල්ලීම සාධාරණ බැවින් මාර්ගය සංවර්ධනය කර දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රිනී ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.22.අඹකැටිය මාර්ගයේ ඇති ඉන්ටර්ලොක් ගල් ගල්ගොඩේ වත්ත පාරට සවි කිරිම සම්බන්ධවයි.

බිබිල, රදලියද්ද,වැව පාර ලිපිනයෙහි පදිංචි කේ.එම්. ජයවර්ධන මහතා ඇතුළු ගම් වාසින් විසින් ලිපියක් මඟින් රදලියද්ද අඹකැටිය පාර කාපට් අතුරා සංවර්ධනය කරන බැවින් එම පාරේ සවිකර ඇති ඉන්ටර්ලොක් ගල් ඉවත් කරන බැවින් අබලන් වී ඇති ගල්ගොඩේ වත්ත පාරට එම ඉන්ටරලොක් ගල් සවි කර සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර ඒ සඳහා ඇස්තමේන්තු මුදල ලෙස රු.412,635.70ක මුදලක් වැය වන බැවින් එම මුදල සභා අරමුදලින් දැරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රිනී ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.23.බහුකාර්ය ගොඩනැගිල්ල කුලියට දීමේ ගාස්තු වැඩි කිරීම සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බහු කාර්ය ගොඩනැගිල්ල මේ වන විට කුලියට ලබා දෙනු ලබන්නේ දිනකට රු.10,000.00 ක මුදලකට වන අතර මේ වන විට එහි පහසුකම් පුළුල් කරමින් ශබ්ද විකාශන යන්ත්‍ර සවි කර ඇත.ඒ අනුව මින් ඉදිරියට කුලියට දීමේදී ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරන්නේ නම් කුලියට අමතරව ඒ සඳහා දිනකට තවත් රු.4000.00ක මුදලක් හා දින භාගයකට රු.2,000.00 ක මුදලක් අය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රි කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.24.UP ZA – 5164 අංක දරණ බැකෝ ලෝඩර් යන්ත්‍රයේ වම් පස වීදුරුව අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි.

2022.02.04 දින ප්‍රාදේශීය සභා රථ ගාලයේ නවතා තිබියදී වම්පස කුඩා වීදුරුව බිමට කඩා වැටීමෙන් හානියක් සිදු ඇති අතර එය නැවත අලුත්වැඩියා කිරීම සඳහා නියෝජිත ආයතනය වන ඇවොන්ස්මාර්ට් පුද්ගලික සමාගම වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ඔවුන් විසින් එවන ලද ඇස්තමේන්තු වටිනාකම රු.44366.40ක් වන අතර එම මුදල සභා අරමුදලින් දැරීමටත් මෙම අලුත්වැඩියා කිරීම අත්‍යවශ්‍ය කටයුත්තක් බැවින් එය ඉටුකිරීම සුදුසු බවත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.25.ප්‍රාදේශීය සභා කාර්යාල කටයුතු විධිමත් කිරීමට අවශ්‍ය කටයුතු සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධවයි.

LDSP ව්‍යාපෘති ප්‍රතිපාදන මඟින් බිබිල ප්‍රාදේශීය සභා කාර්යාලීය ශ්‍රවණාගාරයේ ස්ථාපිත කරන ලද ශබ්ද විකාශන පද්ධතිය මෙහෙයුම් උපාංග වල ආරක්ෂාව සහ මෙහෙයුම් කාර්ය සඳහා අවශ්‍ය මෙහෙයුම් කුටියක් ස්ථාපිත කල යුතුව ඇති හෙයින් මේ සඳහා සභා අනුමැතියද, ප්‍රාදේශීය සභා කාර්යාලයේ දැනට ස්ථාපිත කර ඇති කාර්යාල කටයුතු මෘදුකාංග පද්ධතිය භාවිතයේ දී වෙළඳ බලපත්‍ර මුද්‍රණය කිරීම සඳහා වර්ණ මුද්‍රණ (color printer) යන්ත්‍රයක් හා කාර්යාලයේ නිලධාරි මණ්ඩලයේ ප්‍රමාණාත්මක ඉහල යෑම නිසා (06 දෙනෙක්) එම නිලධාරින්ගේ කාර්යාල කටයුතු සඳහා මේස පරිඝණක (Desktop Computer i3 Version) 04ක් මිලදී ගැනීමට අවශ්‍යව ඇති හෙයින් මේ සඳහා අනුමැතියද, ක්ෂේත්‍ර නිලධාරින් මඟින් ආදායම් එකතු කිරීමේ කටයුතු සඳහා මිලදී ගන්නා ලද ටැබ් පරිගණක (Tab Computer) 03ක් සඳහා ආරක්ෂිතව භාවිතා කිරීමට අවශ්‍ය මුහුනත් ආවරණය (Tampered Glass) හා ආරක්ෂිත ආවරණ (Pouch) ලබා ගැනීමට අවශ්‍ය අනුමැතියද හා LDSP ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මඟින් බිබිල සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීමට යෝජිත ශබ්ද විකාශන පද්ධතිය ස්ථාපිත කිරීමේ දී අවශ්‍ය කථන මේසය හා මෙහෙයුම් කුටිය ඉදිකිරිම සඳහා අවශ්‍ය අනුමැතියද ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රිනී ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05.01.26.බිබිල මහජන පුස්තකාලයේ ඡායා පිටපත් සේවාව සම්බන්ධවයි.

බිබිල ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලයේ පාඨක සේවා අවශ්‍යතාව මත ඔවුන්ගේ ඡායා පිටපත් ලබා දීමේ සේවාව තුල දැනට පවතින ලිපි ද්‍රව්‍යන්හි මිල වෙනස් වීම හේතුවෙන් පවතින මිලට (A4 - ඡායා පිටපත් සඳහා තනි පැත්ත රු.3.00ක් ද,දෙපැත්ත රු 5.00ක් ද වශයෙන්) ලබා දීමට හැකියාවක් නොමැති බවත් A4 බණ්ඩලයක් රු.3000.00 වශයෙන් ආයතනයට ලබ ගන්නා බවත්, පුස්තකාල කටයුතු සඳහා කාර්යාලයෙන් A4 කොල ලබා ගැනීමේ අපහසුතාව නිසාත්

කාලීන වශයෙන් ඡායාපිටපත් සේවාව ලබා දීමට සුදුසු මිලක් තීරණය සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රිනී ඒ.එම්. නදීශා ජයමිණී ගුණසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරිමට මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී කේ.එම්. කපිල විජේසූරිය මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
එහිදී A4 - ඡායා පිටපත් සඳහා තනි පැත්ත රු.8.00ක් ද,දෙපැත්ත රු 10.00ක් ද සුදුසු බවත් සාමාජිකයින් සඳහා මෙම සහනය ලබා දීම සුදුසු බවට සාකච්ඡා විය.

අනතුරුව කාරක සභාව නැවත මහසභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්. ශ්‍රියානන්ද දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
A4 - ඡායා පිටපත් සඳහා තනි පැත්ත රු.8.00ක් ද,දෙපැත්ත රු 10.00ක් ද සුදුසු බවත් සාමාජිකයින් සඳහා මෙම සහනය ලබා දීම සුදුසු බවත් තීරණය කරන ලදී.
ඉන් අනතුරුව යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී අදාළ තීරණය හා යෝජනාව සම්බන්ධයෙන් මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවුයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.01.27. කොම්පොස්ට් හා කසල අංගනයේ ආරක්ෂාව සඳහා මුරකරුවන් දෙදෙනකු බඳවා ගැනිම සම්බන්ධවයි.**

දැනට කොම්පොස්ට් හා කසල අංගනය වන අලින්ගෙන් ආරක්ෂා කර ගැනිම සඳහා විදුලි වැටක් ඉදි කර ඇති අතර එහි විදුලි වැට සඳහා විදුලිය ලබා දී ඇත්තේ සූර්ය පැනලයක් මගිනි. එහි සවි කර ඇති බැටරිය හා ඊට අදාල උපාංග සොරුන් විසින් පෙබරවාරි මස ගලවා පැහැර ගොස් ඇත. එසේම මෙහි දැනටමත් කොම්පොස්ට් පොහොර නිෂ්පාදන කටයුතු ආරම්භ කර ඇති පසුබිමක දී ඊට අදාල උපකරණ හා පොහොරවල ආරක්ෂාවද සපයා ගත යුතුව ඇත.එමෙන්ම නිතර නිතර වන අලින් විසින් භූමියට පැමිණ මෙම උපකරණවලට හානි සිදු කරන අවස්ථා ඇති බැවින් ඒවායේ ආරක්ෂාව සඳහා මුරකරුවන් දෙදෙනකු (සේවා මුර ක්‍රමයට) බඳවා ගැනිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.
අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.

එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06. කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.**
**06.01. 2022 අප්‍රේල් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව සම්බන්ධවයි.**

මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව ඉදිරිපත් කරන ලදි.
එම වාර්තාව මඟින් ඔවුන් යෝජනා කර තිබුනේ බිබිල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022 වර්ෂයේ සුනඛයින් සඳහා ජලභීතිකා එන්නත් කිරීමේ වැඩසටහනට සමගාමීව සුනඛයින්ට යෙදීමට ලබාගත් කරපටි 5000ක් වෙනුවෙන් බිල්පත් ගෙවීම. රු. 125000/= ක මුදලක් G.H.P. ඉමාලී ප්‍රියංගිකා මහත්මිය වෙත ගෙවීමට නිර්දේශ කිරීම, බිබිල ප්‍රාදේශීය සභා ජල යෝජනා ක්‍රමයේ මහියංගන මාර්ගයේ ජලනල එලීම සඳහා යොදා

ගන්නා ලද බැකෝලෝඩර් යන්ත්‍රය සඳහා බිල් ගෙවීම. රු. 113400/= ක මුදලක් A.S.S. බන්දුල මහතා වෙත ගෙවීමට නිර්දේශ කිරීම, ග්‍රාමීය හා පාසල් යටිතල අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ බිබිල ප්‍රාදේශීය සභා මහජන ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේ කටයුතු සඳහා යොදා ගන්නා ලද JCB යන්ත්‍රය වෙනුවෙන් මුදල් ගෙවීම. රු. 315850/= ක මුදලක් A.S.S. බන්දුල මහතා වෙත ගෙවීමට නිර්දේශ කිරීම, බිබිල ප්‍රාදේශීය සභාවට අයත් අංක UP ZA 5419 දරණ මෝටර් ග්‍රේඩරය සඳහා 2022 හා 2023 යන වර්ෂ වලට අදාල රක්ෂණ වාරික ගාස්තු ගෙවීම. රු. 126666.57 ක මුදලක් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවීමට නිර්දේශ කිරීම, 2021 පොදු අරමුදල් යටතේ එගොඩ කොටගම වරලකැටිය බෝක්කුව ඉදිකිරීම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීම වෙනුවෙන් බිල් ගෙවීම. රු. 334206.06 මුදලක් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලය වෙත ගෙවීමට නිර්දේශ කිරීම, බිබිල ප්‍රාදේශීය සභාවේ වැඩ සඳහා ලබාගත් තණකොළ කපන යන්ත්‍රය සඳහා බිල්පත් පියවීම. රු. 138000/= ක මුදලක් ජුපිටර් රේඩියෝ වෙත ගෙවීමට නිර්දේශ කිරීම, 2022 පොදු අරමුදල් යටතේ රතුපස්කැටිය ගහල මාර්ගය කොන්ක්‍රිට් කිරීම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීම වෙනුවෙන් බිල්පත් පියවීම. රු. 421172.87 ක මුදලක් සමගි ගොවි සංවිධානය වෙත ගෙවීමට නිර්දේශ කිරීම, විශේෂ අවශ්‍යතා ගම්මාන සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ 2021 බිබිල කපුගොල්ල වත්තේ සිට 1 කණුව දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් බිල් ගෙවීම. රු. 134989.20 ක මුදලක් වීර කැප්පෙටිපොල ගොවි සංවිධානය වෙත ගෙවීමට නිර්දේශ කිරීම, ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ නාගල ප්‍රජා ශාලාව අළුත්වැඩියා කිරීම ව්‍යාපෘතියේ බිල්පතේ කොටස් මුදලක් ගෙවීම. රු 500000/= ක මුදලක් නාගල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට නිර්දේශ කිරීම හා Settlement of Bills for The Construction of Day care Center, Ayurveda, Public utilities Center for Publication of advertisements in Daily News Dinakaran Din mina News Paper on 01.04.2022. රු. 128887.20 ක මුදලක් The Associated News Paper of Ceylon Limited වෙත ගෙවීමට නිර්දේශ කිරීම සුදුසු බවයි. එහි දී මන්ත්‍රී මණ්ඩලයේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජ්. උබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාව විමසිය.
එහිදී ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය ඒ සඳහා හිමිවූයෙන් කාරක සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලිම.

2022 අප්‍රේල් මාසයට අදාල ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07)සභාවේ දැනගැනීම හා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි.

**ආදායම්**

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | **- රු. 7,754,790.28** |
| මූලධන ලැබීම් | **- රු. -** |
| **ප්‍රාග්ධන ලැබීම්** | **-** රු. - |
| වෙනත් ලැබීම් | - රු. 274,847.11 |
| මුළු ලැබීම් | - රු **8,029,637.39** |

**වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 6,962,468.86 |
| ප්‍රාග්ධන වියදම් | - රු. 1,143,546.72 |
| ණය ආපසු ගෙවීම් | - රු. - |
| වෙනත් වියදම් | - රු. 1,865,963.95 |
| ආයෝජන | රු. - |
| මුළු වියදම් | - රු 9,971,979.53 |

**2022.04.30 දිනට තවදුරටත් හිග ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 7,342,934.74 |
| අක්කර බදු | - රු. 5,415.68 |
| ජල ගාස්තු | - රු. 841,403.88 |
| ජල රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 258,632.00 |
| කුලී මුදල් | - රු. 2,410,976.69 |
| ටෙන්ඩර් මගින් කුලියටදීම් | - රු. 5,131,907.52 |
| එකතුව | - රු 15,991,270.51 |

ඉදිරිපත් කර ඇති ඉහත ආදායම් හා වියදම් වාර්තා ගරු මන්ත්‍රී බී. විල්මට් සිල්වා මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අනතුරුව මෙම ආදායම් වියදම් හා හිඟ වාර්තා සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා සභාවේ එකඟතාවය විමසන ලදි.
ගරු සභාවේ මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාද ඊට එකඟතාවය පලකළෙන් ආදායම් වියදම් හා හිඟ ආදායම් වාර්තා ඒකමතිකව සභා සම්මත විය.

## 08.වෙනත් කරුණු

**ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා අදහස් දැක්විම.**

ගරු මන්ත්‍රී කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමා අදහස් දක්වමින් අද වන විට රට බැරෑරුම් තත්වයකට පත්ව ඇති අතර දේශපාලනය කිරීමේ දී මන්ත්‍රීවරුන් බොහෝ වගකීමෙන් වැඩ කළ යුතුයි. එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා මුහුණු පොතේ තමාගේ හා එම්.ඒ. උබේසේන මැතිතුමාගේ නම සඳහන් කර ගෝඨාගෝගම ප්‍රහාරයට සම්බන්ධ වූ බව සටහනක් කර ඇත. එදා ධර්මදාස බණ්ඩාර මහතාගේ හා රංජිත් මද්දුම බණ්ඩාර මහතාගේ මැරකම්වලට බිය නොවී දේශපාලනය කල පුද්ගලයෙක් බවත් තමා තරඟ කර මන්ත්‍රීධුරයට පත් වූ බවත් මෙවැනි නින්දිත ක්‍රියාවන් නොකිරීමටත් තමා කිසිවිටෙක මිනිසෙකු මරන්නට කොටන්නට නොයන බවත් තමන්ට හිමි වූ මන්ත්‍රීධුරයේ වගකීමෙන් වැඩ කරන ලෙසත් මහින්ද රාජපක්ෂ මහතා LTTE යුද්ධය අවසන් කර අද මේ තත්වයට රට ගෙන ඇති බවත් ඔක්කොම කුණු බේරේ වැවට වගේ කුණු එතුමාගේ පිටෙන් ගිය බවත් අදටත් තමාගේ නායකයා ලෙස මහින්ද රාජපක්ෂ මහතාව සලකන බවත් ඒ.එම්. තිලක් අත්තනායක මැතිතුමා තමාගේ කතාව වීඩියෝ කර බවත් එයට තමා අකමැති බවත් අන්තිමට පොහොට්ටුවේ එල්ලුනාට තමා එසේ නොවන බවත් මෙම ආණ්ඩුව පිහිටුවීමට මුල සිටම කටයුතු කළ බවත් තමා තමාගේ නායකයන්ට ඕනෑ එකක් පෙන්වන ලෙසත් තමාගේ කතා වීඩියෝ නොකරන ලෙසත් කරන දෙයක් වැදගත් මන්ත්‍රීවරයකු ලෙස කරන ලෙසත් රනිල් වික්‍රමසිංහ මහතා රටේ මෙවන් තත්වයක් තිබිය දී රට

භාර ගත් බැවින් එතුමාට සියළුදෙනාගේ සහයෝගය ලබා දෙන ලෙසත් ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා අදහස් දැක්වීම.**

ගරු මන්ත්‍රී එම්.ඒ. උබේසේන මැතිතුමා අදහස් දක්වමින් මන්ත්‍රීවරු 17 දෙනා එක් අයෙක් විය යුතු බවත් පක්ෂය කුමක් වුවත් බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා පැවසූ ආකාරයට ගම්වල වැසිකිලි නොමැති අය කී දෙනෙක් නම් ඇත්ද, නගරයේ අඩුපාඩු පිළිබඳව සාකච්ඡා කළ යුතු බවත් නවක අදහස් ඇති මන්ත්‍රීවරුන් සිටින බවත් විවිධ මත භේද නිසා අදහස් ඉදිරිපත් නොවන බවත් අපේ රටට ද මෙවැනි තත්වයක් නිර්මාණය වී ඇත්තේ මෙවැනි හේතු නිසා ද වන බවත් 1971 න් පසු පත් වූ සියළු නායකයින් මෙයට වගකිව යුතු බවත් මහජනතාව කියන දේවල් අපේ නායකයින් අහන්නේ නැති බවත් ගෝල්ෆේස් පිටියේ ඇති වූ අරගලයට අප විරුද්ධ බවත් සිවිල් ජනතාව කියන දේ හා ඔවුන්ගේ අදහස් නොගැනීම නිසා මෙම ගැටළු නිර්මාණය වූ බවත් ගෝල් ෆේස් එක තුළ සිදු වූ ගැටළුවෙන් පසු රටතුල ඇති වූ ගැටුම්කාරී තත්වය ද (නිවාස හා දේපල විනාශ කිරීම) අනුමත නොකරන බවත් ඇතැම් දේවල් පුද්ගලික පලි ගැනීම් මත සිදු වූ බවත් එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා මුහුණු පොත තුළ දමා තබූ සටහන නිසා ජනතාව තමන් පිළිබඳ සොයා බැලූ බවත් තමාට ආදරය කරන විශාල ජනතාවක් සිටින බව දැනුන විට සතුටක් ඇති වූ බවත් එයට එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමාට ස්තූතිවන්ත වන බව ප්‍රකාශ කරමින් මෙවැනි දේවල් කිරීමට පෙර මීට වඩා සැලිකිලිමත් විය යුතු බවත් තමා ජනතාව වෙනුවෙන් කටයුතු කරන බවත් මාසික දීමනාව නොමැතිව වුවත් ජනතාව වෙනුවෙන් කටයුතු කරන බවත් දේශපාලන ජීවිතයේ දී තමා පෙලපාලියකට සම්බන්ධ වී හුවක්වත් කියා නොමැති බවත් ප්‍රකාශ කරන ලදී. අපේ නායකයින් අපට හා අපේ ජනතාවට ඇහුම්කම් නොදන බවත් ඒ හේතුව නිසා අද මෙවැනි තත්වයකට මුහුණ දී ඇති බවත් රනිල් වික්‍රමසිංහ මහතා රටේ අයහපත් කාල වකවානුවක රට භාර ගැනීම නිසා එතුමාට සහයෝගය දක්වමින් රට ගොඩනැගීමට කටයුතු කලයුතු බවත් මන්ත්‍රීවරුන් වෙත ලබා දෙන මාසික සභා වාර්තාවේ මුද්‍රණ දෝෂ හා අඩුපාඩු පරික්ෂාකර බලා නිවැරදි වාර්තාවක් මන්ත්‍රීවරුන්ට ලබා දීමට කටයුතු කරන ලෙස ලේකම් තුමිය ගෙන් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දැක්වීම.**

ගරු මන්ත්‍රී එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා අදහස් දක්වමින් තමා සමාජ මාධ්‍ය ජාලාව වැඩිපුර භාවිතා කරන පුද්ගලයෙක් බවත් නගරයට රුස්වූ අවස්ථාවේ දී ආවේගශීලි ලෙස සිදු වූ දෙයක් බවත් කොයිම මොහොතකවත් ප්‍රාදේශීය සභාවක නමක් හා මන්ත්‍රීවරුන්ගේ නමක් සඳහන් නොකෙරූ බවත් නිකම් නම් දෙකක් පමනක් සටහන් කල බවත් කෙලින්ම තමාට ඇගිල්ල දික් කළ නොහැකි බවත් එයින් මන්ත්‍රීවරුන්ට යම් අපහසුතාවයක් සිදු වූ වා නම් තරුණ දේශපාලකයෙක් ලෙස බිබිල නගරයේ සංවිධායකයකු ලෙස සමාව භජනය කරන බවත්, ගරු අමාත්‍ය විජිත බේරුගොඩ මහතාගේ ගෙය වටලා උද්ගෝෂණය කළ අවස්ථාවේ තමාගේ සහෝදරයොත් එක්ව උද්ගෝෂණයට එක්වූ පිරිස නැවත කැඳවාගෙන ඒමට කටයුතු කළ අතර එච්.එම්. සරත් කුමාර මැතිතුමා ද ඒ සඳහා සහයෝගය දක්වා ඇති බවත් මෙවැනි අවස්ථාවක රට ගොඩනැගීමට රනිල් වික්‍රමසිංහ මහතා පාර්ලිමේන්තුවේ පක්ෂයක සිටින තනි පුද්ගලයෙක් ලෙස රට භාර ගැනීම පිලිබඳ ගෞරවයක් ඇති බවත් ,එතුමාට යම්තාක් දුරට ජනතාවට යහපතක් කිරීමට හැකි බවත් එතුමා දේශපාලන ගමනෙන් සමු ගන්නා විට තමා ද දේශපාලන ගමනෙන් සමු ගන්නා බවත් එතුමා වගේ නායකයෙකු බිහිවුවහොත් පමණක් දේශපාලන කරන බවත් ගෙවල් දොරවල් කඩා ගැනිමට තමා අකමැති බවත් ගෝල් ෆේස් ගැටළුවේ දී ගෙවල් දොරවල් ගිනි තැබිමට තමා අකමැති බවත්1989 දී තමන්ට ද පැවති භිෂණය පිලිබඳ අත්දැකීම් ඇති බව ප්‍රකාශ කරන ලදී.තමා විටින් විට ඉල්ලිමක් කළ කාරණයක් වන විල්මට් සිල්වා මන්ත්‍රීතුමාගේ කොට්ඨාශයට අයත් සතිපොලේ පිටවීමේ මාර්ගයේ දකුණු පැත්තේ එළවළු, මාළු හා තවත්

වෙළඳසැල් ඉදි කිරීම පිළිබඳ විරුද්ධ නොමැති බවත් 2022 පෙබරවාරි 22 වන දින සභා වාරයේ දී සභාපතිතුමා වෙත ලිපියක් ඉදිරිපත් කරමින් වම් පස මාර්ගයේ වෙළඳසැල් ඉවත් කර ගමන් කළ හැකි ආකාරයට සකස් කර දෙන ලෙස ඉල්ලීමක් කළ නමුත් කියන්නත් සනතෝෂයි අපෙනුත් යෝජනා සම්මත කරගෙන කුඩා ව්‍යාපාරකයින්ට ජංගම වෙළඳකුටි 20ක් පමණ මාර්ගයේ සවි කර ඇත. මේ හේතුව නිසා ගමට යන්නට ලැජ්ජා බවත් සභාවේ මන්ත්‍රීවරු වී සිදු කරන්නේ කුමක් ද යන්න මිනිසුන් අසන ප්‍රශ්නවලට කුමක් පවසන්නද යන්නත් ප්‍රකාශ කරන ලදි.එම කඩ පේලිය ඉවත් කර ඉඩ ඇති වෙනත් ස්ථානයකට රැගෙන යන ලෙස ගරු සභාපතිතුමාට දුරකතනයකින් දැනුවත් කළ අතර එතුමා තානායම ඉදිරිපිටට රැගෙන යා හැකි බව දැන් වූ බවත් බස් නැවතුම්පොලේ ඉන්ධන පිරවුම් හලේ ඉදිරිපිට ලොතැරැයි කූඩුව ඉදිරිපිට ඇති ලොතැරැයි කූඩු හතරක් පමණක් ලියාපදිංචි කර ඇති අතර ඒවායින් දෙකක් පමණ ලියාපදිංචි කර නොමැති බවත් එම ලොතැරැයි කූඩු බස්නවතුම්පල දෙසට රැගෙන ඒම නිසා වාහන දෙකක් මාරු වීමට නොහැකි වන සේ මාර්ගය අවහිර වී ඇති බවත් කොන්ක්‍රීට් එක දෙසට මෙම ලොතැරැයි කූඩු ගන්නේ නම් මෙම ගැටළුව විසදෙන බවත් වහාම මෙය සිදු විය යුත්තක් බවත් පුබුදු වෙලඳසැල ඉදිරිපිට දමා ඇති ලොතරැයි කූඩුව ද ඉවත් කර දෙන ලෙස වෙළඳ සංගමයෙන් තමා වෙත ඉල්ලීමක් කර ඇති බැවින් එයට අදාල කටයුතු කර දෙන ලෙසත් වෙළඳ සැල් බෙදා දෙන විට විනිවිද භාවයකින් යුතුව බෙදා හරින්නේ නම් සුදුසු බවත් නගරයේ අලංකරණය කිරිම සඳහා වෙළඳ කුටි විදිමත්ව ස්ථානගත කිරීම සුදුසු බවත් පවසමින් සිය අදහස් දැක්වීම නිමා කරන ලදි.

**<u>ගරු සභාපති එස්.ඒ.එම්.චන්ද්‍රසේකර බංඩා මැතිතුමා</u>**

ගරු උප සභාපති එස්.ඒ.එම්.චන්ද්‍රසේකර බංඩා මැතිතුමා පිළිතුරු කථාව කරමින් සැහෙන කාරණා සමූහයක් සාකච්ඡා කළ අතර මන්ත්‍රීවරුන් ඒ සම්බන්ධව තීන්දු තීරණ ගත් බවත් පසු ගිය කාලයේ දී සිදු වූ සිදුවීම් පිළිබඳ සිහි කළ අතර කේ.එම්.ඒ. බන්දුල ජයවර්ධන මැතිතුමාට වඩා එතුමාගේ පියානන් සමඟ තමා දේශපාලනය කළ බවත් පසුගිය කාලයේ දී සිදු වූ අවාසනාවන්ත සිදු වීම් පුද්ගලික අමනාපකම් මත ඇති වී ඇති බවත් එය අවස්ථාවක් කර ගත් ඇතැම් මිනිසුන් එයින් අයුතු ප්‍රයෝජන ගෙන ඇති බවත් අපි ඒ අතින් වාසනාවන්ත බවත් එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා පැවසූ ආකාරයට තමන්ගේ ප්‍රදේශ තමන් ආරක්ෂා කර ගත යුතු බවත් පැවසීම පිළිබඳ ඉතා සතුටු වන බවත් අපේ අතෙන් වැරද්දක් සිදු වූවානම් සමාව ගැනීම සුදුසු දෙයක් බවත් එය එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා සිදු කළ බවත් ප්‍රකාශ කරන ලදී.ගෝල් ෆේස් ගැටළුව සිදු වූ අවස්ථාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී විජිත බේරුගොඩ මහතා සමඟ වැඩසටහනකට අපේ ඇතැම් මන්ත්‍රීවරුන් සම්බන්ධ වී සිටි අතර තත්වය සුදුසු නොමැති නිසා තමා එයට සහභාගි නොවූ බව ප්‍රකාශ කරන ලදී.හවස් වන විට ගරු අමාත්‍ය විජිත බේරුගොඩ මහතාගේ නිවසට ගල් ගැසූ බව ආරංචි විය නමුත් එතුමා දේශපාලන ගමනේ එතරම් කුරිරු පුද්ගලයෙකු නොවන බවත් ඒ කටයුතු වලක්වා ගැනීමට කටයුතු කිරිම පිළිබඳ සතුටු වන බවත් ප්‍රකාශ කරන ලදී.උදේ සිට අප සාකච්ඡා කලේ බිබිල ප්‍රදේශයේ සිදු වූ අඩුපාඩු සම්බන්ධයෙන් බවත්, එම්.ජී. පුන්සඳ විජය කුමාර මැතිතුමා විසින් බී. විල්මට් සිල්වා මැතිතුමාගේ කොට්ඨාසයේ ඇති සති පොල පිටවුම් මාර්ගයේ ගැටළුව පිළිබඳ යෝජනා ඉදිරිපත් කළ අතර ඒ පිළිබඳවද අවධානය යොමු කිරීම සුදුසු බවත් මෙවන් කාල වකවානුවක රනිල් වික්‍රමසිංහ මහතා රට භාර ගැනීම පිළිබඳ සතුටු වන බවත් අපේ නායකයින් අපි කියන දේ නොඇසීම නිසා අද මෙවන් තත්වයකට රට මුහුණ දී ඇති බවත් දේශපාලන දැක්ම තනතුරු ගන්නා අයට වඩා අපි දන්නා බවත් දැන් සියළු දෙනාම එකම වලේ වැටී ඇති බවත් පැවසීය. රහස් පොලීසියෙන් තමා ගෝල් ෆේස් විරෝධතාවයට සහභාගි වනවාද යන්න දුරකතන මාර්ගයෙන් විමසූ බවත් තමා විසින් එයට අපි කවුරුවත් සහභාගි නොවන බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.අප මෙතනට පත් කළ ජනතාවට අපි වග කිව යුත්තෝ ලෙස පක්ෂ විපක්ෂ

භාවයකින් තොරව ඉටු කළ යුතු බවත් සියළු දෙනාම සහයෝගයෙන් මෙම ගමන යා යුතු බවත් ප්‍රකාශ කරමින් සිය පිළිතුරු කථාව නිමා කරන ලදි.

මීළඟ මාසික සභාව 2022 ජූනි මස 21 වන අඟහරුවාදා පෙරවරු 9.30ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පැවැත් වීමට තීරණය කරමින් සභාවේ වැඩකටයුතු අවසන් කරන ලදි.

ජී.ජී.ආර්. සිල්වා,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

ජී.ජී.ආර් සිල්වා
සභාපති
බිබිල ප්‍රාදේශීය සභාව
බිබිල

පිටපත්

01. ඌව පළාතේ පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03. විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව, මොණරාගල- කා.දැ.ගැ.පි.

ගරු සභාපති ජී.ජී.ආර්. සිල්වා මැතිතුමාගේ යෝජනා යටතේ ,

**<u>05.01.18. නාගරික හා ළමා උද්‍යානයක් ඉදි කිරීම සඳහා ඉඩමක් ලබා ගැනීම සම්බන්ධවයි.</u>**

කේ.එම්.ජී. බන්දුල ජයවර්ධන මැතිතුමා

කරුණු පැහැදිලි කිරීම.

කේ.එම්.ජී. බන්දුල ජයවර්ධන මැතිතුමා, මෙම යෝජනාව කර ඇත්තේ මෙම ඉඩම **ලක්ෂ 50 ක් පමණ වටිනාකමකින් යුක්ත වන අතර එම ඉඩම තක්සේරු කොට** සභා අරමුදලින් ලබා ගැනීම සුදුසු බවටයි. එබැවින් මෙම ඉඩම තක්සේරු කර එක වර නොකර එකින් එක කිරීම සුදුසු බවත් මෙම ඉඩමට අනාගතයේ දී හොඳ වෙළඳ වටිනාකමක් ලැබෙන බැවින් මෙම ස්ථානය සුදුසු බවට අදහස් දැක්වීම ඇතුලත් කර සංශෝධනය කිරීම.

බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා

කරුණු පැහැදිලි කිරීම.

බී.එම්. ජයලත් බණ්ඩාර මැතිතුමා, පොදු වෙළඳපල මාර්ගයේ ගල් ගැලවී පයින් මෙන්ම වාහනවලින්ද ගමන් කිරීමට නොහැකි බවත් එවැනි මාර්ග සංවර්ධනය සඳහා මුදල් යෙදවීම මෙම ඉඩම් මිල දී ගන්නවාට වඩා සුදුසු බවට දැක්වූ අදහස ඇතුලත් කර සංශෝධනය කිරීම.